මගේ අංකය 3/5//2 –IV

චක්‍රලේඛ අංක - 06/2016

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23
දුම්රියපොළ පාර
බම්බලපිටිය.
2016.06. 23.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,
සියළුම බලකා අණදෙන නිලධාරීන් / පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්

<u>තනතුර හැර යාමේ නිවේදන නිකුත් කිරීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි I කාණ්ඩයේ XV වන පරිච්ඡේදයේ 172 වෙනි වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නොදන්වා රාජකාරියට වාර්තා නොකර සිටින සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කිරීම දෙපාර්තමේන්තු මූලස්ථානයේ මූලස්ථාන මාණ්ඩලික නිලධාරී වෙත ද, බලකා මූලස්ථාන සඳහා අදාල බලකා අණදෙන නිලධාරීන් වෙත ද, පුහුණු පාසල් සඳහා පුහුණු පාසල් භාර අණදෙන නිලධාරීන් වෙත ද මින් පවරමි.

2. ඒ අනුව තනතුර අතහැර යාමේ නිවේදනය අදාල නිලධරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි අංක 12 පරිශිෂ්ටය ප්‍රකාරව (ඇමුණුම 01) වහාම දන්වා යැවීම ඔබගේ වගකීම වේ. එසේ දන්වා යැවීම කළ පසු එහි පිටපත් පත්කිරීමේ බලධරයා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් වෙත හා අදාල අනෙකුත් බලධරයන් වෙත යැවීමට ක්‍රියා කළ යුතු වේ.

3. තවද කිසියම් සිවිල් ආරක්ෂක සාමාජිකයෙකු නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව නොවැළැක්විය හැකි හේතුවක් මත රාජකාරී සඳහා වාර්තා කිරීමට අපහසු වන අවස්ථාවකදී එම දිනයේ එම නිලධාරියාගේ රාජකාරී ආරම්භ කිරීමට නියමිතව තිබූ වේලාවේ සිට පැය 24 ක කාලයක් තුළ කුමන ආකාරයකින් (2013.11.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2013(ඇමුණුම 02)) හෝ නිවාඩු අනුමත කරන ආයතන ප්‍රධානියා වශයෙන් ඔබ වෙත දැනුම් දී නොමැති නම් එවැනි අයෙක් සඳහා විධිමත් සොයා බැලීමකින් පසු තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට හැකිවේ. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XV වන පරිච්ඡේදයේ 173 වෙනි වගන්තිය ප්‍රකාරව එම නිලධරයාගෙන් එසේ තනතුර අතහැර යාම සම්බන්ධව නිදහසට කරුණු විමසීමක් හෝ ඔහු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු වේ.

4. තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කළ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත, එසේ තනතුර අතහැර ගියා සේ සැලකෙන නිලධරයා විසින් තමන් රාජකාරියට වාර්තා නොකිරීම පිළිබඳව සිය කැමැත්තෙන්ම, ලිඛිතව, අදාල අණදෙන නිලධාරියා මඟින් විනය බලධරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා සිටියහොත්,අදාළ විනය රීතීන්ට අනුකූලව එම හේතු සලකා බැලිය හැකි වේ. ඉන් අනතුරුව දඩුවම් සහිතව හෝ රහිතව හෝ ඔහු නැවත තනතුරෙහි පිහිටුවීම හෝ නොඑසේ නම් තනතුරෙහි ප්‍රතික්ෂේප කිරීමට හෝ විනය බලධරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල් හට ක්‍රියා කළ හැක.

5. එසේ හෙයින් මින් ඉදිරියට සිවිල් ආරක්ෂක සාමාජිකයින් දීර්ඝ කාලීනව නිවාඩු නොගෙන නොපැමිණීම සම්බන්ධව වාර්තා වීමට ඉඩ නොතැබීමට ඔබගේ පූර්ණ අවධානය යොමු කළ යුතු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/1186 දරන ලිපිය මඟින් දෙපාර්තමේන්තුවේ අණදෙන නිලධාරී තනතුරු පූර්ණ ලෙස අනුමත කරන ලද 2016.02.12 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන බව ද දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

ඇමුණුම 01

අංක 12 පරිශිෂ්ටය

**(172 වගන්තිය)**

ලිපිනය:...............................................

...............................................

දිනය:...............................................

යොමු අංකය:...............................................................

...............................................මයා/මිය/මෙනවිය

...............................................................................

...............................................................................

තනතුර අතහැර යාමේ නිවේදනය

මෙම දෙපාර්තමේන්තුවේ .................................................................. තනතුර දරමින් සිටි ඔබ විධිමත්ව නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව, .................................................. දින සිට රාජකාරිය සඳහා වාර්තා කොට නොමැත.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ 172 වැනි වගන්තිය ප්‍රකාරව ......................................................... දින සිට ඔබ තනතුර අතහැර ගියා සේ සැලකෙන බව මෙයින් දැනුම දෙමි.

03. ඔබ විසින් රජයෙන් ලබා ගෙන ඇති සියලුම අත්තිකාරම් හා ණය මුදල් ....................................................... දිනට පෙර පියවීමට කටයුතු කරන්න. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඒවා අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදු වනු ඇත.

04. තව ද ....................................................... දිනට පෙර ඔබ භාරයේ ඇති රජයේ සියලු දේපල, ලිපිලේඛන, යතුරු පරිගණක මුර පද හා රාජකාරී හැඳුනුම් පත ආදිය විධිමත් පරිදි භාර දීමට කටයුතු කරන්න. එසේ භාර දීමට අපොහොසත් වුවහොත් ඒ පිළිබඳව ද නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවනු ඇත.

05. තම තනතුර අතහැර යාමේ හේතුව මත, රජයේ තනතුරකට නැවත පත් කරනු ලැබීමට ඇති අයිතිවාසිකම ද, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම ද ඔබට අහිමි වන්නේ ය.

අත්සන:...............................................

නම:...............................................

තනතුර:...............................................

පිටපත්: 1.පත්කිරීම් බලධරයා

2.විගණකාධිපති

ඇමුණුම 02

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 24/2013

මගේ අංකය:- EST-7/LEAVE/03/3460
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2013.11.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදයේ 2:5, XII පරිච්ඡේදයේ 1:5 සහ XXVIII පරිච්ඡේදයේ 6:4 උප වගන්තීන් සංශෝධනය කිරීම.</u>**

ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදයේ 2:5, XII පරිච්ඡේදයේ 1:5 සහ XXVIII පරිච්ඡේදයේ 6:4 උප වගන්තීන් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි VI පරිච්ඡේදයේ 2:5 උප වගන්තිය අවලංගු කිරීමටත්, XII පරිච්ඡේදයේ 1:5 උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමටත් XXVIII පරිච්ඡේදයේ 6:4 උප වගන්තියෙහි සඳහන් "විදුලි පණිවිඩය" යන්න "ටෙලිමේල් පණිවිඩය" ලෙස සංශෝධනය කිරීමටත් 2013.10.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇති බව දන්වමි.

1:5 ඉතා හදිසි අවස්ථාවක දී නිලධරයෙකුට සේවයට වාර්තා කිරීමට නොහැකි වන විටක දී ඒ බව ටෙලිමේල් පණිවිඩයක් / දුරකථන පණිවිඩයක් / කෙටි පණිවිඩයක් (SMS) / විද්‍යුත් තැපැල (e-mail) මගින් සිය ආයතන ප්‍රධානියා වෙත දැනුම් දිය හැකි අතර, සේවයට වාර්තා කළ වහාම විධිමත් ආකෘති පත්‍රයෙන් නිවාඩු අනුමත කරවා ගත යුතුය.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය